**සී/ස ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන (පුද්ගලික) සමාගම - 2018**

---

## 1.1 තත්ත්වාගණනය කළ මතය

සී/ස ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන (පුද්ගලික) සමාගමේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ලාභ හා අලාභ ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි එලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ එලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන**

-----------------

**1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

----------------------------------------------------------

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගම විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 1 හි 17 ජේදයට පටහැනිව 2018 වර්ෂයේ මූල්‍ය තත්ව ප්‍රකාශයේ මුළු ජංගම නොවන වත්කම් එකතුව රු.93,613,705 ක් වෙනුවට රු. 4,293,459 ක් ලෙසත්, හිමිකම් වෙනස්වීම් ප්‍රකාශයේ එකතුව තීරුව යටතේ 2018 ජනවාරි 01 දිනට එකතුව රු.270,689,599 ක් වෙනුවට රු.270,779,599 ක් ලෙසත්, 2018 දෙසැම්බර් 31 දිනට එකතුව රු.223,985,617 ක් වෙනුවට රු.40,891,115 ක සෘණ ශේෂයක් ලෙසත් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශනයන්හි දෝෂ නිවැරදි කිරීමට කටයුතු කරමි. | මූල්‍ය ප්‍රකාශන ප්‍රමිතයේ ප්‍රතිපාදන ප්‍රකාරව ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | 2018 දෙසැම්බර් 31 දිනට කොල්ලුපිටිය අලෙවිසැලෙහි අවසන් තොගය ශ්‍රී ලංකා ගිනුම්කරණ ප්‍රමිත 2 හි 9 ජේදය ප්‍රකාරව පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගයෙන් වඩා අඩු අගයට ගණනය කළ යුතු වුවත්, එයට පටහැනිව රු. 399,044 ක් වූ වෙළඳපල මිලට මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | 2019 වර්ෂයේ නිවැරදිව කිරීමට කටයුතු කරමි. | මූල්‍ය ප්‍රකාශන ප්‍රමිතයේ ප්‍රතිපාදන ප්‍රකාරව පිළියෙල කළ යුතුය. |
| (ඇ) | පිරිවැය රු.මිලියන 33ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය කළ දේපල, පිරියත හා උපකරණ තව දුරටත් සමාගම විසින් ප්‍රයෝජනයට ගනිමින් පැවතියද, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 යෙහි 51 ජේදය ප්‍රකාරව අදාල වත්කම් වල එලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කර ගිණුම්වල අවශ්‍ය කරන ගැලපුම් සිදු කර නොතිබුණි. | ඉදිරි මූල්‍ය ප්‍රකාශන තුළින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමටත්, ප්‍රමිතයෙහි 79 ජේදය ප්‍රකාරව හෙළිදරව් කිරීමටත් කටයුතු කරමි. | මූල්‍ය ප්‍රකාශන ප්‍රමිතයේ ප්‍රතිපාදන ප්‍රකාරව පිළියෙල කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාගමට අයත් සත්ව ආහාර ඇඹරුම් යන්ත්‍රය 2016 වර්ෂය තුලදී රු.3,853,490 ක් වැයකර අළුත්වැඩියා කර තිබූ නමුත් එය 2019 ජුනි 12 දින දක්වා නිෂ්කාර්යව පැවතුණි. එහෙත් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 36 හි 9 ඡේදය ප්‍රකාරව යන්ත්‍රයේ හානිකරණය සඳහා අවශ්‍ය වෙන්කිරීම් මූල්‍ය ප්‍රකාශනවල සලසා නොතිබුණි. | සත්ව ආහාර නිෂ්පාදනය කිරීම සඳහා ඉහළ පිරිවැයක් යන බැවින් හා වෙළඳපලින් මිලදී ගන්නා සත්ව ආහාර සඳහා අවම පිරිවැයක් යන බැවින් එම යන්ත්‍රය තුළින් සත්ව ආහාර නිෂ්පාදනය කර නොමැත. මෙම යන්ත්‍රයෙන් මුදල් ප්‍රවාහයක් ජනනය නොකළත් වාර්ෂිකව රු.578,024 ක මුදලකින් (15%) ක්ෂය කරනු ලබයි. | ව්‍යාපෘතියක් සඳහා මුදල් වැය කිරීමට පෙර සක්‍යතා අධ්‍යයනයක් සිදු කළ යුතු අතර එම යන්ත්‍රය භාවිතයෙන් ඉවත් කිරීමට පෙර එමගින් නිෂ්පාදනය වන ආහාරවලට ඉහළ පිරිවැයක් යනවාද එහි ගුණාත්මක තත්වය පිළිබඳ පරීක්ෂාවට හා ඇගයිමට ලක් කළ යුතු අතර යන්ත්‍රයේ හානිකරණයට අදාළව වෙන් කිරීම් මූල්‍ය ප්‍රකාශනවල සැලසිය යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේදී රු.7,687,939 ක ආදායමක් හෙවත් සමස්ත ආදායමෙන් සියයට 11.92 ක දායකත්වයක් පොල් හා ආශ්‍රිත නිෂ්පාදනවලින් ලබාදී තිබීයදී පොල් වගාවෙහි වටිනාකම පිරිවැයට හෝ සාධාරණ අගයට තක්සේරු කර මේරූ වගාවක් ලෙස ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 41 හි 45 ඡේදය ප්‍රකාරව ගිණුම්ගත කරනවා වෙනුවට නොමේරූ වගාවක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | පොල් වගාව පිරිවැය හෝ සාධාරණ අගයට මූල්‍ය ප්‍රකාශන තුලින් ඉදිරිපත්කිරීමට ඉදිරියේදී කටයුතු කරමි | ප්‍රමිතයේ ප්‍රතිපාදන ප්‍රකාරව පොල් වගාව පිරිවැය හෝ සාධාරණ අගයට මූල්‍ය ප්‍රකාශන තුලින් ඉදිරිපත් කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 දිනට පැවති රු.3,476,588 ක් වටිනා කිකිළියන් 4,398 හා එම කිකිළියන් සඳහා සමාලෝචිත වර්ෂය තුල වැය කර තිබූ ප්‍රාග්ධනිත කළ යුතු රු.3,872,164 ක ආහාර හා ඖෂධ පිරිවැය සමාලෝචිත වර්ෂයේ අවසාන තොගයට ඇතුලත් කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය හා තොගය රු.7,348,752 කින් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරමි. | ප්‍රාග්ධනිත කළ යුතු වියදම් නිවැරදිව ප්‍රාග්ධනිත කර නිවැරදි අගයන් මූල්‍ය ප්‍රකාශන මගින් ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාලව මූල්‍ය ප්‍රකාශයන්හි දක්වා තිබූ රු.2,785,767 ක ක්ෂය වෙන්කිරීම හා දේපල පිරියත සහ උපකරණවල ලියා හල අගය වන රු.82,868,230 ක ශේෂයන්හි නිරවද්‍යතාවය විගණනයේදී තහවුරු කරගත නොහැකි විය. තවද ඒ හේතුවෙන්ම 2017 වර්ෂයට පෙර මිලදී ගෙන අපහරනය කර තිබූ ස්ථාවර වත්කම්වලින් පැනනැගී තිබූ ලාභය හෝ අලාභය ද නිවැරදිව ගිණුම් ගත කිරීමට නොහැකි වී තිබුණි. | නිවැරදි ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වාගෙන යාමට ඉදිරියේ දී කටයුතු කරමි | ඉදිරියට ගෙනෙන ලද වත්කම් වල ද තොරතුරු ඇතුළත් කර ස්ථාවර වත්කම් ලේඛණයක් යාවත් කාලීනව පවත්වා ගත යුතුය. |
| (ඇ) | බැටළුවන්ට අදාල රු.304,360 ක ක්ෂය ගිණුම්වල ගලපා නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | බැටළුවන්ට අදාළ ගිණුම් නිවැරදි කිරිමට ඉදිරියේ දී කටයුතු කරමි. | ක්ෂය නිවැරදිව ගිණුම්ගත කර නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කළ යුතුය. |
| (ඈ) | බැටළුවන්ට අදාල වත්කම් වටිනාකම වැඩිවීමේ ගිණුමේ (Appreciation) බැර ශේෂය රු.1,150,700 ක් වුවද එය රු. 807,175 ක් ලෙස ගණනය කර දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය රු.343,525 කින් අඩුවෙන් දක්වා තිබුණි. | බැටළුවන්ට අදාළ ගිණුම් නිවැරදි කිරිමට ඉදිරියේ දී කටයුතු කරමි. | බැටළුවන්ට අදාල වත්කම් වටිනාකම වැඩිවීමේ ගිණුමේ (Appreciation) බැර ශේෂය නිවැරදිව ගිණුම්ගත කර නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයට අදාල රු.495,041 ක් වූ වෙළඳ තොග හා රු.98,363 ක් වූ ලිපිද්‍රව්‍ය තොග 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයට ගෙන නොතිබීම හා ලාභ අලාභ ගිණුම තුළින් ගලපා නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය හා තොගය රු.593,404 කින් අඩුවෙන් දක්වා තිබුණි. | තොග නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. | තොග සමීක්ෂණය අනුව පැවති තොගය අගය කිරීම නිසි අධීක්ෂණයක් යටතේ සිදු කළ යුතුය. |
| (ඊ) | 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පොලි ආදායම රු. 1,465,645 ක් වුවත්, එය රු. 1,540,487 ක් ලෙස දැක්වීම හේතුවෙන් ජංගම වත්කම් රු. 74,841 කින් වැඩියෙන් දක්වා තිබුණි. | පොලි ආදායම් නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කරමි | ලැබිය යුතු පොලී ආදායම් නිවැරදිව ගිණුම්ගත කර නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | සමාලෝචිත වර්ෂයේ පොලි ආදායම රු. 5,556,168 ක් වෙනුවට රු. 5,315,298 ලෙස සටහන් කර තිබීම හේතුවෙන්, වර්ෂයේ ශුද්ධ අලාභය රු. 240,870 කින් වැඩියෙන් දක්වා තිබුණි. | පොලි ආදායම නිවැරදිව ගිණුම් ගත කිරීමට කටයුතු කරමි. | පොලි ආදායම් නිවැරදිව ගිණුම්ගත කර නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කළ යුතුය. |
| (ඌ) | ආදායම් බදු ගණනය කිරීම සඳහා ගැලපු ආදායම ගණනය කිරීමේදී, බදු පෙර අලාභය වෙනුවට බදු පසු ශුද්ධ අලාභය යොදාගැනීම නිසා රු. 967,713 කින් ගැලපු ආදායම අධිගණනය වී තිබුණි. | මෙම තත්වය මගහැරීමට ඉදිරියේදී කටයුතු කරමි | බදු ගණනය කිරීම් නිවැරදිව ගිණුම්ගත කර නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කළ යුතුය. |

**1.5.3 අනුචිත ඇගයීම හෝ ඇස්තමේන්තු කිරීම**

---------------------------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජීව විද්‍යාත්මක වත්කම් හා අනෙකුත් තොග සමීක්ෂණය කිරීමේදී නිරීක්ෂණය සඳහා ස්වාධීන විගණනයේ සහය නොගැනීමෙන් ස්වාධීන පාර්ශවයන් මගින් අධීක්ෂණය නොවීම මත තොගයෙහි පැවැත්ම හා අගය කිරීම පිළිබඳ විගණනයට සෑහීමකට පත්විය නොහැකි විය. | තොග ගණනය කිරීමේදී ස්වාධීන විගණනයට දැන්වීමට කටයුතු කරමි. | තොග සත්‍යාපනය නිරීක්ෂණය සඳහා බාහිර විගණකගේ සහය ලබා ගැනීමට ක්‍රියා කළ යුතුය. |

**1.5.4 අඛණ්ඩ පැවැත්ම**

--------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල 2.1.2 සටහනේ අඛණ්ඩ පැවැත්ම යටතේ වාර්තා කරන කාලපරිච්ඡේදය හා ඊට අදාල අලාභය රු. 17,180,418 ක් වෙනුවට රු.16,210,773 ක් ලෙස දක්වා තිබුණි. එසේම 2007 අංක 07 දරන සමාගම් පනතෙහි 220 වගන්තිය ප්‍රකාරව තදබල ප්‍රාග්ධන පාඩුවක් පවතින බව දක්වා තිබුණද, සමාගමෙහි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව ප්‍රකාශිත ප්‍රාග්ධනය රු.100,040,816 ක් හා ශුද්ධ වත්කම් ප්‍රමාණය රු.223,985,617 ක් වී තිබුණි. | මූල්‍ය ප්‍රකාශනයන්හි දෝෂ නිවැරදි කිරීමට කටයුතු කරමි. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව ඉදිරිපත් කළ යුතුය. |

**1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

---------------------------------------------

| විෂය | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| වෙළෙඳ ලැබිය යුතු ශේෂය | රු.1,560,456 ක් වූ ඉන්වොයිසි පත්, භාණ්ඩ ලැබීමේ තුණ්ඩු හා ශේෂ සනාථ කිරීම් | වෙළඳ ලැබිය යුතු රු.1,560,456 ක ශේෂය ආයතනය පවරා ගන්නා අවස්ථාවේ සිට ඉදිරියට එන ශේෂයකි. එම ශේෂයන්ට අදාල | ශේෂපත්‍රයේ දක්වා ඇති වත්කම්වලට පදනම් වූ අදාළ ලියකියවිලි හා තොරතුරු පවත්වාගත |

| | | |
|---|---|---|
| | ලිපිලේඛණ සමාගම සතු නොවේ. | යුතුය. |

| | | |
|---|---|---|
| ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයෙන් ලැබිය යුතු ශේෂ රු. 5,071,910 ක් වූ ශේෂ සනාථ කිරීම් | පිළිතුරු ඉදිරිපත් කර නැත. | ශේෂ තහවුරු කිරීම් විගණනයට ලබාදීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**1.6 ලැබිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මෙම සමාගම ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට 2014 මැයි මස පවරා ගැනීමෙන් පසු 2014 ජුලි 08 දින කළ ඉල්ලීම මත මව් සමාගමට ලබාදෙන ලද රු. 140,000,000ක මුදලක් මූල්‍ය ප්‍රකාශනයේ සටහන අනුව සමාගමේ ලාභාංශ මගින් අයකරගැනීමට කටයුතු කරන බව දක්වා අත්තිකාරමක් ලෙස ජංගම වත්කම්හි දක්වා ඇත. සමාගම 2014 සිට 2018 වර්ෂය දක්වාම අලාභ ලබමින් පවතින බැවින් ඉදිරි මාස 12 ක කාලය තුල මෙය පියවිය නොහැකි බව නිරීක්ෂණය විය. | ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට ගෙවන ලද අත්තිකාරම් රු.140,000,000 ක් සම්බන්ධයෙන් දැනුවත් කර ලිපියක් NLDB මූල්‍ය කළමනාකාරතුමා වෙත ලබා දීමට කටයුතු කරමි. | සමාගමේ කාරක ප්‍රාග්ධනය හිගකමක් පවතින බැවින් ණය අයකර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

**1.7 සම්බන්ධිත පාර්ශවයන් හා සම්බන්ධිත පාර්ශව ගනුදෙනු හෙළිදරව් නොකිරීම**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2011 වර්ෂයේදී රු.මිලියන 2.25 කට අගය කර තිබූ හා රු.75,000 ත් රු.80,000 ත් අතර වූ මාසික ආදායමක් ලැබූ බාන්ස් පෙදෙසෙහි පිහිටි නිවස 2015 ජුනි මස 20 දින සිට ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට ලබාදී තිබුණද ඒ බව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කිරීමට ඉදිරියේදී කටයුතු කරමි. | සම්බන්ධිත පාර්ශවයන්ට අදාළ ගණුදෙනු චක්‍රලේඛවලට අනුකූලව සිදු විය යුතු අතර මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කිරීමද කළ යුතුය. |
| (ආ) | සමාගම විසින් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ ඉල්ලීම පරිදි ඔවුන් වෙනුවෙන් වත්කම් මිලදී ගැනීම හා වෙනත් වියදම් වෙනුවෙන් වැයකර තිබූ රු. 675,995ක් හා 2015 වර්ෂයේදි මණ්ඩලය වෙත ලබාදී තිබූ රු. 4,089,477 ක් වටිනා සතුන් වෙනුවෙන් සමාගමට අයවිය යුතු එකතුව රු. 4,765,472 | මේ සම්බන්ධව ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය දැනුවත් කිරීමට නැවත කටයුතු කරමි. | සම්බන්ධිත පාර්ශවයන් සමග සිදු කරනු ලබන ගණුදෙණු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |

ක් 2019 ජූනි 30 දින දක්වාම සමාගම විසින් අයකරගෙන නොතිබුණි.

## 1.8 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | සාංගමික සංස්ථා පත්‍රයේ 22(1) (b) ඡේදය | සාංගමික සංස්ථා පත්‍රයට අනුව සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලය තෝරා ගැනීමේදී සමාගමේ කොටස්වලින් සියයට සියයක් අයිතිය පවතීනම් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයම සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය ලෙස පත් විය යුතු වුවත්, එයට අනුකූල නොවී වෙනත් අධ්‍යක්ෂක මණ්ඩලයක් පත්කර තිබුණි. | සාංගමික සංස්ථා පත්‍රය අනුව නිවැරදි විය යුතුය. | අධ්‍යක්ෂ මණ්ඩලය පත්කිරීමේදී සාංගමික සංස්ථා පත්‍රය අනුව ක්‍රියා කළ යුතුය. |
| | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| (i) | මුදල් රෙගුලාසි 110, 454(1), 454(2) | 2019 ජූනි 12 දින දක්වාම හානි හා පාඩු පිළිබඳ ලේඛනයක්, විගණන විමසුම් ලේඛනයක්, විදුලි උපකරණ පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ලේඛණ නඩත්තු කිරීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ලේඛන තබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි. 756 සහ 757 | 2018 වර්ෂයට අදාලව සමාගමේ වාහන සම්බන්ධයෙන් භෞතික සමීක්ෂණයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි ii කාණ්ඩයේ vi උපලේඛන අනුව වාහන ලේඛනයක් පිළියෙල කිරීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ලේඛන තබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (iii) | මුදල් රෙගුලාසි 1645(අ) | 267 වැනි ගොණු ආකෘති පත්‍රය ප්‍රකාරව වාහන ලොග් සටහන් පොත් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 1645(අ) නියමයන්ට අනුව 267 වැනි ගොනු ආකෘති පත්‍රය ප්‍රකාරව වාහන | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ලොග් සටහන් පොත් පවත්වාගෙන යාමට කටයුතු කරමි. | |
| (ආ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛනයක් යාවත්කාලීන කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්නා ගෙන යාමට කටයුතු කරමි. | ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිජ් අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන නොතිබුණි | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය ඉදිරියේදී පවත්නා ගෙන යාමට කටයුතු කරමි. | ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2015 ජුනි 17 දිනැති අංක පී.ඊ.ඩී. 3/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 2.2 වගන්තිය | චක්‍රලේඛයට අනුකූල නොවන පරිදි දීමනාව තීරණය කර වර්ෂය තුල වරින් වර සභාපතිවරු 3 දෙනෙකු හට දීමනා ලෙස රු.440,000 ක් ගෙවීම් කර තිබුණි. | ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය මෙම සමාගමේ මව් සමාගම වේ. මව් සමාගමේ තීරණයට එකග විය යුතුය. මෙය ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | චක්‍රලේඛය ප්‍රකාරව ගෙවීම් සිදු කළ යුතුය. |
| (ඉ) | 2015 මැයි 25 දිනැති අංක පී.ඊ.ඩී .1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 3.1 වගන්තිය | නිල වාහන හිමි නොවන තනතුරක් සඳහා දීමනා ගෙවීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගත යුතු වුවත්, එවැනි අනුමැතියක් ලබා නොගෙන ගොවිපල කළමනාකරුට මාසිකව කිලෝ මීටර් 500 ක පෞද්ගලික පරිහරණයට ඉන්ධන දීමනාවක් එකඟවී පසුව එම සීමාවද 2018 මැයි 14 දින සිට එහි කිලෝමීටර් 900 ක් දක්වා වැඩි කර තිබුණි. . | මව් සමාගමේ තීරණයට අනුව කටයුතු කරනු ලැබේ | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 1.9 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ගිණුම් අංක 309-1001-00004944 දරන මහජන බැංකු ගිණුමේ අනුමත බැංකු අයිරා ශේෂය රු. මිලියන 20 ක් වුවත් නොවැම්බර් හා දෙසැම්බර් මාස තුළදී අදාළ ශේෂය ඉක්මවා රු . 2,681,072 ක් දක්වා ගනුදෙනු සිදු කර තිබූ බව නිරීක්ෂණය විය. | 2018 නොවැම්බර්, දෙසැම්බර් මාසවලදී වෙළඳපොලෙහි මිල ගණන් අඩු වීම මත නිෂ්පාදන අලෙවි කර ගත නොහැකි විය. ඒ අනුව ආයතනයේ ආදායම් මට්ටම පහළ බැස තිබූ බැවින් අත්‍යවශ්‍ය වියදම් සඳහා රු.මිලියන 20 ක ශේෂය ඉක්මවා යාමට සිදුවිය. | කාරක ප්‍රාග්ධනය ප්‍රශස්ථ මට්ටමක පවත්වා ගැනීමට කළමණාකරණය ක්‍රියා කළ යුතුය. |

## 1.10 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2017/2018 තක්සේරු වර්ෂයට අදාළ රු.409,562 ක් වූ බදු වගකීම 2018 සැප්තැම්බර් 30 දිනට හෝ ඊට පෙර ගෙවිය යුතු වුවත්, 2019 ජුනි 13 දින වන විටත් ගෙවා නොතිබුණි. ඒ හේතුවෙන් සමාගම දඩ මුදල් ගෙවීමේ වගකීමකට බැඳීමට ඉඩ කඩ ඇති බව නිරීක්ෂණය විය. | සමාගමේ ආදායම් මට්ටම පහත බැස තිබෙන අවස්ථාවක ආදායම් බදු ගෙවීම සඳහා කළමනාකරණ ඉඩ දෙනු නොලැබේ. ඉදිරියේදී මෙම තත්ත්වය මඟ හරවා ගැනීමටත් බදු වාර්තා නියමිත දිනට භාරදීමටත් කටයුතු කරමි. | 2017 අංක 24 දරන දේශීය ආදායම් බදු පනතට අනුකූල විය යුතුය. |

## 1.11 තොරතුරු තාක්ෂණ (IT) පොදු පාලන ක්‍රම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාගම විසින් වැටුප් වේතන සැකසීම සඳහා පරිගණකයේ Excel මෘදුකාංගය භාවිත කරනු ලබයි. එසේ වුවද එම පරිගණක යන්ත්‍රය සඳහා නිලධාරීන් ප්‍රවේශවීම සීමා කිරීමක් නිරීක්ෂණය නොවුණි. | රහස් මුරපද භාවිතා කිරීමට කටයුතු කරමි. | රහස් මුරපද භාවිතය මගින් අවසර නොලත් නිලධාරීන් පද්ධතියට ප්‍රවේශවීම වැළැක්විය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 16,212,705 ක පාඩුවක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ පාඩුව රු. 15,284,383 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.928,322 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ආදායමෙහි අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 2.2 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ සමාගමෙහි ජංගම වත්කම් ලෙස රු.218,821,712ක් පවතින නමුත් ඒ අතරින් ස්ථාවර තැම්පත් වටිනාකම රු.55,569,537ක් ද, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය වෙනුවෙන්, 2014 වර්ෂයේ අත්තිකාරම් ලෙස ලබාදුන් රු.140,000,000 ක් හා 2015 වර්ෂයේ වැය කළ රු.5,071,910 ක අගයත් තොරතුරු නොමැතිවීම මත අයකරගත නොහැකි රු. 1,560,456 ක අගයත් අඩුකළ පසු ජංගම වත්කම්වල අගය රු.16,619,809 ක් වේ. සමාගමෙහි ජංගම වගකීම් අගය වන රු. 70,498,011 ට අනුව ජංගම වත්කම් අනුපාතය 0.23ක් වන අතර සමාගමෙහි ද්‍රවශීල වත්කම් අනුපාතය 0.05 ක් වේ. ඒ අනුව සමාගමෙහි කාරක ප්‍රාග්ධන හිගයක් පවතින බව නිරීක්ෂණය වේ. ඉහත පරිදි පසුගිය වර්ෂයේ එම අගය රු.16,125,125 ජංගම වත්කම් අනුපාතය 0.84 ක් ද ද්‍රවශීල වත්කම් අනුපාතය 0.24 ක් බව නිරීක්ෂණය විය. තවද 2017 වර්ෂයේදී සීයයට 23ක් වූ දළ ලාභ අනුපාතය 2018 වර්ෂයේදී සීයයට 16ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වෑන් රථයක් 2016 නොවැම්බර් අනතුරකින් පසු අළුත්වැඩියා කිරීම සඳහා ලද අවම ලංසුව වූ රු. 335,000 ක් හා අමතර කොටස් සඳහා රු.215,000 ක් යොජනා වූ නමුත් 2016 නොවැම්බර් 16 දින සිට 2018 අප්‍රේල් 18 දක්වාම වෑන් රථය අළුත්වැඩියා නොකිරීම හේතුවෙන් එය දිරාපත් වීම මත විකිණීම වාසිදායක බව තිරණය කර ටෙන්ඩර් කැඳවා රු.2,773,800 කට විකිණීමට 2019 මාර්තු 09 දින එකඟවී ඇත. වෑන් රථයට අදාළ පිරිවැය හෝ අනතුරට පත්වීමට පෙර එහි වටිනාකම අගය කර ඇස්තමේන්තු කර නොමැති බැවින් වාහනයෙන් සිදුවී ඇති අලාභය හඳුනා ගැනීමට නොහැකි බව නිරීක්ෂණය විය. | පිළිතුරු ලබාදී නොමැත | මුදල් රෙගුලාසි 104(1) ප්‍රකාරව පාඩු හා හානි සම්බන්ධයෙන් වහාම ක්‍රියාකළ යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව සමාගම විසින් මූල්‍ය වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුලත කෙටුම්පත් වාර්ෂික වාර්තාවක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවද එසේ ඉදිරිපත් කර නොතිබුණි. | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සහා කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | චක්‍රලේඛ ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන නිවැරදිව ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | කාර්යසාධන වාර්තාවක් පිළියෙල කර නොකිරිම හේතුවෙන්, ක්‍රියාකාරී සැලැස්මේ සැලසුම් කළ සියලුම ක්‍රියාකාරකම් එම වර්ෂය තුළ ක්‍රියාත්මක කළේද, යන්න පරික්ෂා වී ඒ පිළිබඳ ඇගයිම් කිරිමට අවශ්‍ය පසුබිම සකස් කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | කළමණාකාරීත්වය විසින් කාර්යයසාධන වාර්තා සකස් කර අරමුණු කරා ලගා වීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | පොල් ව්‍යාපෘතිය මඟින් 2017 වර්ෂයේ දි රු. 9,178,272 ලාභයක්ද 2018 වර්ෂයේ දී රු.4,688,099 ලාභයක් ද උපයා ඇති අතර 2017 වර්ෂයට වඩා 2018 වර්ෂයේදී උපයන ලද ලාභය රු. 4,490,173 ක අඩුවීමක් පෙන්වන බව නිරීක්ෂණය විය. එසේ ම 2017 වර්ෂයේ පොල් ව්‍යාපෘතියේ දළ ලාභ අනුපාතය 84% ක් වන අතර 2018 වර්ෂයේ දි එය 55% ක් දක්වා අඩුවී තිබුණි. | 2018 වර්ෂයේ සිට සියලුම කම්කරු ශ්‍රමිකයන් අදාළ ව්‍යාපෘතිවලට බෙදා වෙන් කරන බැවින්, පොල් ව්‍යාපෘතිය සඳහා නියමිත කම්කරු ශ්‍රමය වෙන් කර ගැනීමට හැකිවිය. 2017 වර්ෂයේ කම්කරු ශ්‍රමය අදාළ ව්‍යාපෘතියේ පෙන්වා නොමැති අතර එය ව්‍යාපාර පරිපාලන වියදම් යටතේ ඇත. | කළමනාකරණය විසින් ව්‍යාපාරික කටයුතු කාර්යක්ෂමව පවත්වාගනිමින් ව්‍යාපාරික අරමුණු ඉටුකරගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | අක්කර 330 ක භූමි ප්‍රමාණයක් මෙම ගොවිපල සතු වන අතර එහි ප්‍රධානව සිදුකරන පොල් වගාවට අමතරව අඹ, තැඹිලි, තේක්ක ගස් වගාකර ඇති ගස් පිළිබඳ ලේඛණ පවත්වා නොතිබු අතර සංගණනයක්ද කර නොතිබුණි. | පොල්, අඹ, තැඹිලි,තේක්ක සඳහා 2018 වර්ෂය තුළ සංගණන වාර්තාවක් නොමැති බව සත්‍යකි. 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට පොල් ගස් ගණනය කිරීමට අපේක්ෂා කරමි. | සංගණනයක් සිදුකර ඒ අනුව වාර්තා යාවත්කාලීන කිරීමටත්, මූල්‍ය ප්‍රකාශන ඒ අනුව පිළියෙල කිරීමටත් කටයුතු කළ යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්‍ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අක්කර 330 ක භූමි ප්‍රමාණයේ ප්‍රධාන වශයෙන් පොල් වගාව යටි වගාවක් රහිතව පවතින බව භෞතික පරීක්‍ෂාවේදී නිරීක්‍ෂණය විය. එවැනි යටි වගාවක් තුළින් උපයා ගැනීමට තිබූ අමතර ආදායම අහිමි වී ඇති බවත් සමහර ප්‍රදේශ වල කැලේ කපා ඉවත් නොකිරීම නිසා පොල් ගස් වෙත ලගා වීමට නොහැකි වී වීමත් පොහොර යෙදීම නිසි ලෙස සිදු නොවීමත් හේතුවෙන් සමාගම සතු වත්කම් උපරිම ආදායම් ලැබෙන සේ පාලනය කර නොමැති බව භෞතික පරීක්ෂණයේදී නිරීක්‍ෂණය විය. | පොල් වගා අක්කර 330 භූමි ප්‍රමාණයක් තුළ පැවතුනත්, එම භූමි ප්‍රමාණය එළිපෙහෙළි කිරීම සඳහා අප ආයතනය සතුව ඇත්තේ ට්‍රැක්ටර් 2 ක් පමණි. දැනට සිටින කම්කරුවන් සංඛ්‍යාවද පවතින Breeder ව්‍යාපෘතිය සඳහා ප්‍රමාණවත් නොවන බැවින්, එම කම්කරුවන්ද භූමිය එළි පෙහෙළි කිරීම් සඳහා යොදවා ගත නොහැකිය. | සමාගමේ සම්පත් වලින් උපරිම ඵලදායිතාවය ලැබෙන අන්දමට පද්ධති හා පාලනයන් හඳුන්වාදිය යුතුය. |

## 3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහඃ දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2005 ජුනි 16 දිනැති අමාත්‍ය මණ්ඩල තිරණය අනුව උපදේශකවරුන් පත්කිරීමේදී පැවරීමට නියමිත කාර්යභාරය හා කාලය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගත යුතු වුවත්, එසේ කටයුතු නොකොට උපදේශන සේවා ප්‍රසම්පාදනයට අදාළව 2017 නෙවැම්බර් නිකුත් කර ඇති මාර්ගෝපදේශන සංග්‍රහයේ 4.3 හා 4.4 වගන්තිවලට අනුකූල නොවී වසරකට වැඩි කාලයක් සඳහා උපදේශකවරුන් දෙදෙනෙකු පත් කර තිබුණි. 2015 ජුනි 01 සිට අවුරුදු 03 මාස 06 ක් සඳහා පත් කර තිබූ ඉංජිනේරු උපදේශක විසින් පත්වීම් ලිපිය ප්‍රකාරව ඉටුකළ යුතු කාර්‍යභාරයන් ඉටු කළ බවට කිසිදු තහවුරුවක් ලබා නොගෙන මසකට රු.20,000 බැගින් රු. 840,000 ක් ගෙවා තිබුණි. | පශු සම්පත් සංවර්ධන මණ්ඩලය යනු සීමා සහිත ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන (පුද්ගලික) සමාගමේ මව් සමාගම වේ. එම මණ්ඩලයේ උපදේශකයින්ම අප සමාගමේ උපදේශකයින් ලෙසද පත්කර ඇත. | 2005 ජුනි 16 දිනැති අමප/05/විවිධ/(026) දරන අමාත්‍ය මණ්ඩල තිරණය අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ගොවිපලේ භෞතික පරීක්ෂාවේදී තැඹිලි ගස් 50 ක් පමණ නිරීක්‍ෂණය වූ අතර වර්ෂය තුළ තැඹිලි වලින් ඉපයූ ආදායම රු. 5,070 ක් වීම අනුව එක් ගසක වාර්ෂික ආදායම රු.101 ක් පමණ වූ බව නිරීක්‍ෂණය විය. ඒ අනුව තැඹිලි ආදායමෙහි නිරවද්‍යතාව තහවුරු කළ නොහැකි විය. | ගොවිපලේ තැඹිලි ගස් 50 ක් පමණ ප්‍රමාණයක් ඇතත්, එම ගස්වල දීර්ඝ කාලයක් තිස්සේ පොහොර නොදමා තිබීම නිසා ඵලදාව නොමැති වීම එයට හේතුවයි. මේ වන විට පොහොර දමා අවසන් කර ඇත. | සමාගම සතු සම්පත් වලින් උපරිම ඵලදායීත්වයක් ලැබෙන පරිදි නඩත්තු කළ යුතුය. |

**3.5 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ ප්‍රසම්පාදන සැලැස්මේ ප්‍රසම්පාදන ක්‍රමවේදය හා කාල වකවානු කුමක් ද යන්න පැහැදිලිව දක්වා නොතිබුණි | ආයතනයේ ප්‍රාග්ධන මිලදී ගැනීම්, වැඩ කොන්ත්‍රාත්, භාණ්ඩ මිලදී ගැනීම් සඳහා නිශ්චිත කාලසීමාවක් දැක්විය නොහැකිය. ආයතනයේ මූල්‍ය තත්ත්වය අනුව අතවශ්‍යම මිලදී ගැනීම් සඳහා පමණක් මුල් තැන දෙනු ලැබේ. | රජයේ ප්‍රසම්පාදන නියමයන්ට අනුකූලව ප්‍රසම්පාදන සැලැස්ම සකසා ගත යුතුය. |

**3.6 වෙනත් සංවිධානවලට මුදාහළ සම්පත්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගම සතු කැබ් රථ 2ක් හා කාර් රථයක් පිළිවෙලින් 2015 හා 2017 වර්ෂයේ සිට ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය වෙත නිදහස් කර තිබුණද අදාල වාහන නිත්‍යානුකූලව පවරා දීමට කටයුතු කර නොතිබුණි. | මෙම වාහන සම්බන්ධයෙන් ඉදිරියේදී පියවර ගැනීමට කටයුතු කරමි. | සම්පත් බාහිර ආයතන වෙත භාරදීමේදී ඒවා විධිමත් අධිකාරියක් සහිතව පවරා දීමට ක්‍රියා කළ යුතුය. |

**3.7 වෙනත් සංවිධානවල සම්පත් උපයෝජනය කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2010 වර්ෂයේ දී ව්‍යාපෘති අධ්‍යක්ෂක, උතුරු වසන්තය ව්‍යාපෘති යටතේ ලියාපදිංචි කර ඇති ඩබල් කැබ් රථයක් සමාගම භාවිතයට ගනු ලැබුවද, අදාළ රථයෙහි අයිතිය සමාගම වෙත පවරා ගැනීමට මේ වනතෙක් කටයුතු කර නොතිබුණි. | අයිතිය පවරා ගැනීමට කටයුතු කරමි. | සම්පත් භාවිතයේදී නිසි අධිකාරියක් සහිතව වත්කම් භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |

**3.8 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ස්ථිර සේවකයින් 20 දෙනෙකුට අදාලව පෞද්ගලික ලිපි ගොනු පරීක්ෂාවේදී, කිසිඳු ලිපි ගොනුවක නිලධාරීන් විසින් ඉදිරිපත් කර තිබූ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් ඇතුළත් සහතික අදාළ ආයතනවලින් නිවැරදි බවට තහවුරු කර ගෙන නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | නිලධාරින් බඳවා ගැනීමේදී නිළධාරීන් විසින් ඉදිරිපත් කර තිබූ සහතිකවල නිවැරදිතාවය අදාළ ආයතන මගින් සහතික කරගත යුතුය. |
| (ආ) | බඳවා ගැනීමේ පටිපාටිය හා සේවක සංඛ්‍යාව අනුමත කර නොතිබුණි. | සේවකයින් බඳවා ගැනීමේ පටිපාටිය හා සේවක සංඛ්‍යාව අනුමත කර ගැනීමට අදාල ලිපි ලේඛණ හා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව 2019 අගෝස්තු 26 දින පැවැත්වෙන අධ්‍යක්ෂ මණ්ඩල රුස්වීමට ඉදිරිපත් කර ඇත. | බඳවා ගැනීමේ පටිපාටිය හා සේවක සංඛ්‍යාව අනුමත කරගැනීමට කටයුතු කොට ඉන් පසු බඳවා ගැනීම් කළ යුතුය. |
| (ඇ) | සමාගමේ අනුමත බඳවා ගැනීමේ පටිපාටියක් හා අනුමත සේවක සංඛ්‍යාවක් නොමැතිව 2015 ජනවාරි 01 සිට 2019 ජුලි මස 31 දින දක්වා නිලධාරීන් 21ක් බඳවාගෙන තිබුණු අතර රජයේ අනුමත වැටුප්තල සැලකීමේදී මෙම නිලධාරීන්ගේ වැටුප් තලයන් අඩු අගයන් වන බවත් වැටුප් වර්ධකය අසාමාන්‍ය ලෙස අඩු අගයක් බව නිරීක්ෂණය විය. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | බඳවා ගැනීමේ පටිපාටිය හා සේවක සංඛ්‍යාව අනුමත කරවාගෙන සුදුසු වැටුප් තලවලට සේවකයින් බඳවා ගැනීමට ක්‍රියාකළ යුතුය. |

**3.9 වාහන පද්ධතිය කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වාහන අළුත්වැඩියා කිරීමේදී ඉවත් කරන ලද අමතර කොටස් උපකරන, මෙවලම් සම්බන්ධව ලේඛනයක් නඩත්තු කර නොතිබුණ අතර ඉවත් කරන ලද අමතර කොටස්ද ආරක්ෂාකාරී ලෙස තැබිමට ක්‍රියාකර නොතිබුණි. | ඉදිරියේදී ලේඛනයක් නඩත්තු කිරීමට කටයුතු කරමි. | මූදල් රෙගුලාසි ප්‍රකාරව මනා කළමනාකරණයක් ඇතිකිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 1990 ඔක්තොම්බර් 10 දිනැති 41/90 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2.11 ඡේදය ප්‍රකාරව මාස 06 කට වරක් වාහන වල ඉන්ධන පරිභෝජනය පරීක්ෂාව කළයුතු වුවත් සමාගම යටතේ ඇති වාහන සම්බන්ධව එසේ කටයුතු නොකරන බව නිරීක්ෂණය විය. | ඉදිරියේදී මාස 06 කට වරක් වාහන වල ඉන්ධන පරිභෝජනය පරීක්ෂාව කටයුතු කරමි. | චක්‍රලේඛයේ ප්‍රතිපාදන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**4.** **ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

---------------------------------------

**4.1** **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

----------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ වුවද ,සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මැයි 29 දින එනම් දින 90ක් ප්‍රමාද වී විගණනයට ඉදිරිපත් කර තිබුණි. | 2019 සදහා ප්‍රථම අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමට අදාළ රැස්වීම් වාර්තාව අත්සන් කරනු ලැබුවේ 2019-05-27 දිනැති අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේදීය. | චක්‍රලේඛයේ ප්‍රතිපාදන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය. |

**4.2** **සංයුක්ත සැලැස්ම**

-----------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 12 චක්‍රලේඛයේ 5.1.3 වගන්තිය ප්‍රකාරව මුදල් වර්ෂය ආරම්භවීමට දින 15 කට පෙර පිළියෙල කළ යුතු 2018 වර්ෂයේ ව්‍යාපෘතික සැලැස්ම මේ වන විටත් පිළියෙල කර නොතිබුණි. | ඇස්තමේන්තු (අයවැය) වාර්තාව පමණක් පිළියෙල කර ඉදිරිපත් කර ඇත. | අදාල චක්‍රලේඛයේ ප්‍රතිපාදන ප්‍රකාරව ව්‍යාපාර සැලැස්ම පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. |

**4.3** **වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

-------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 පෙබරවාරි 11 දිනැති අංක 01/2014 රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5(2) ඡේදය ප්‍රකාරව ව්‍යාපාරික සැලැස්ම පදනම් කර ගෙන මුදල් වර්ෂය ආරම්භවීමට දින 15 කට කලින් 2003 ජුනි යහපාලන පිළිබඳ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 වගන්තිය ප්‍රකාරව 2018 වර්ෂය සඳහා ඉදිරිපත් කළ යුතු ක්‍රියාකාරී සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර තිබුණේ 2018 පෙබරවාරි 23 දින දීය. නමුත් එයට ඇතුලත් විය යුතු ණය ආපසු | ඉදිරියේදී ජනවාරි 15 දිනට පෙර පිළියෙල කර ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | 2014 පෙබරවාරි 11 දිනැති අංක 01/2014 රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5(2) ඡේදය ප්‍රකාරව හා 2003 ජුනි යහපාලන පිළිබඳ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 වගන්තිය ප්‍රකාරව කට යුතු කළ යුතු වේ. |

ගෙවීමේ සැලැස්ම, යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සිටින කාර්යමණ්ඩලය පිළිබඳ විස්තරය, මානව සම්පත් සංවර්ධන සැලැස්ම, හා අභ්‍යන්තර විගණන සැලැස්ම ඇතුලත් කර නොතිබුණි

**4.4 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අභ්‍යන්තර විගණන කටයුතු, මව් සමාගමේ අභ්‍යන්තර විගණනය විසින් කරනු ලබයි. 2018 වර්ෂය සඳහා එක් විගණන විමසුමක් නිකුත් කර තිබුණත් ප්‍රමාණවත් විගණනයක් සිදු කර නොතිබුණි. | ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය අප සමාගමේ මව් සමාගම වන බැවින් එම මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය විසින් අප සමාගමේ ද විගණන කටයුතු සිදුකරනු ලබයි. | අභ්‍යන්තර විගණනය මගින් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුවන බවට කළමනාකාරිත්වය වගබලාගත යුතුය. |

**4.5 විගණන කමිටුව**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 වගන්තිය ප්‍රකාරව කාර්තුවකට අවම වශයෙන් විගණන කමිටු එකක් පැවැත්විය යුතු වුවත් එසේ පවත්වා නොතිබුණි. | මෙතෙක් විගණන කමිටු පවත්වා නොමැත. | චක්‍රලේඛයේ ප්‍රතිපාදන ප්‍රකාරව විගණන කමිටු රැස්වීම් පැවත්විය යුතුය. |

**4.6 අයවැය පාලනය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයේ සමාගමේ පොල් ව්‍යාපෘතියෙන් පොල් ගෙඩි 267,150 කින් රු.9,350,250 ක ආදායමක් ඉපයීමට සැලසුම් කර තිබුණත් වර්ෂය තුලදී පොල් ගෙඩි 206,393 ක් නිෂ්පාදනය කර රු.6,834,299 ක ආදායමක් උපයා තිබුණි. එය අපේක්ෂිත ආදායමෙන් සියයට 27 ක අඩුවීමකි. | 2018 වර්ෂය පුරා පැවති නියඟය හේතුවෙන් සමස්ථ ලංකාවේ පොල් නිෂ්පාදනය සාපේක්ෂව අඩු වී තිබුණි. | තාත්වික අයවැයක් මගින් විචලනයන් අඩුකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ පොල් ව්‍යාපෘතිය සඳහා අයවැයගත වියදම රු.6,225,541 ක් වුවද සමාගම විසින් පොහොර නොයෙදවීම වැනි හේතු නිසා සමාලෝචිත වර්ෂයේදි වැය කර තිබුණේ රු.3,769,890 ක් පමණි. එය අයවැයගත වියදමට සාපේක්ෂව සියයට 39කින් අඩු වීමකි. | 2018 වර්ෂය පුරා පැවති නියගය හේතුවෙන් සමස්ථ ලංකාවේ පොල් නිෂ්පාදනය සාපේක්ෂව අඩු වී තිබුණි. | තාත්වික අයවැයක් මගින් විචලනයන් අඩුකර ගැනීමට කටයුතු කළ යුතුය. |